**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ හිඟ ණය ශේෂය රු.245,274 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ලෙස රු.19,355 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග ශේෂය රු.122,007 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂය තුළ මිල දී ගන්නා ලද වටිනාකම රු.440,550 ක් වූ කාර්යාල උපකරණ 18 ක් ද , රු.134,775 ක වටිනාකමකින් යුත් යන්ත්‍ර සහ උපකරණ 52 ක් ද වටිනාකම රු.324,350 ක් වූ ලී බඩු උපකරණ 43 ක් සහ රු.48,000 ක් වූ ගස් කපන යන්ත්‍රයක් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තා අනුව අපහරණය කරන ලද රු.14,337 ක් වටිනා පොත්වල අගය පුස්තකාල පොත් ගිණුමෙහි ඇතුළත්ව තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායම රු.111,080 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (උ) | හෙළ බොජුන් හල ගොඩනැගිල්ල සහ වැසිකිළි පද්ධතියේ වටිනාකම රු.202,387 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දී ඉඩම් සහ ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරන ලද වියදම රු.1,877,452 ක් ප්‍රාග්ධනිත කර නොතිබුන අතර ඉඩම් 04 ක වටිනාකම රු.195,000 ක් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් නඩු 05 ක් පවත්වා ගෙන යන අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 134 වගන්තිය | සභාව විසින් සංවර්ධනය කර සේවා සපයන ප්‍රදේශ දියුණු කළ ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අදාළ වගන්තියේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 570 හා 571 | වටිනාකම 4,144,874 ක කල් ඉකුත් වූ තැන්පත් 179 ක් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර එය සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | චක්‍රලේඛයේ 03,04, 6.3 සහ 6.5 වගන්තිය අදාළව කටයුතු කර නොතිබුණි. | - එම- | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2010 ජූලි 30 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.2. ii. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කටවරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එපරිදි සිදුකර නොතිබුණි. | - එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,529,105 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,816,376 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 වර්ෂය<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | 2022 වර්ෂය<br>ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4810 | 4203 | 3,770 | 4,334 | 3624 | 2297 | 1402 | 4292 |
| කුලී | 14088 | 9615 | 15,024 | 404 | 3563 | 12138 | 6646 | 1203 |
| බලපත්‍ර ගාස්තු | 1391 | 860 | 860 | 0 | 1263 | 874 | 874 | 0 |
| වෙනත් ආදායම් | 158389 | 16197 | 86,925 | 86,764 | 1125141 | 120233 | 639 | 100621 |
| එකතුව | 178,678 | 30,875 | 106,579 | 91,502 | 1,133,591 | 135,542 | 9,561 | 106,116 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් ශේෂය රු.3,856,189 ක් ද අක්කර බදු රු.78,029 ක් අයවිය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.388,765 ක් , හිඟ කඩ කුලී රු.3,975 ක් සහ ජංගම කුටි හිඟ කුලී රු.11,700 ක් අයවිය යුතු ව පැවතුණි. | -එම- | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.7,952,313 ක ශේෂය තුළ වර්ෂයට අදාළ රු.7,270,839 ක් ද, 2016 සහ 2021 වර්ෂ වලට අදාළ රු.681,474 ක් ද විය. 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.75,630,224 ක් විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වරිපනම් ගාස්තු අයකරනු ලබන දේපල සඳහා වසර 05කට වරක් අගය තක්සේරු කර ඒ මත පදනම්ව ගාස්තු අයකළ යුතු වුව ද සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වරිපනම් ගාස්තු අයකරනු ලබන දේපල සඳහා වසර 05කට වරක් අගය තක්සේරු කර ඒ මත පදනම්ව ගාස්තු අයකළ යුතු යි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ කාරණා 03 ක් අතුරු ව්‍යවස්ථා සකස් කර 2020 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අනුමත කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | පනතේ 126 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.534,000 ක් හා පුනරාවර්තන වැය රු.24,259,371 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.472,934 ක් වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 08 ක වටිනාකම රු.91,113,609 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභාව වෙත අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.20,751,241 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතු ය. |
| (ඇ) | සේවකයින් 03ගෙන් රු.369,460 ක අය නොවන ණය ශේෂ පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතු ය. |

## 3.3 නිෂ්කායර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ගිලන් රථය අළුත්වැඩියා කටයුතු සිදු නොකර වසර 02කට අධික කාලයක සිට උපයෝජනයෙන් තොරව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම්වල අගයන් කාලීනව ප්‍රත්‍යාගණනය කර නොකිරීම හේතුවෙන් රු.50, රු.100 වැනි අඩු අගයන්ගෙන් යුතු ඉඩම් වත්කම් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ආ) | ලී බඩු හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබූ අතර වාහන යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ සඳහා වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 02 ක, සුසාන භූමි 31 ක සහ ක්‍රීඩා පිටි 05 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | -එම- | -එම- |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අනුමත කාර්යමණ්ඩල ඉක්මවා අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම යටතේ බඳවා ගත් සේවකයින් 19 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.26,457,889 ක් ගෙවීම් කර තිබුණි. | -එම- | -එම- |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉටුකළ යුතු කර්තව්‍යයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද , එහි දී හඳුනාගත් විශේෂිත දර්ශක මිනුම් කළ හැකි තාර්කික පදනමක් යොදා ගෙන සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ඇගයීම් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ඇගයීම් කළ යුතු ය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 21 ක සිට 95 ක් දක්වා ද වියදම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 25 කට වඩා වැඩියෙන් ද විචලනයන් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ආදායම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතුය. |

### 4.3 තිරසර සංවධර්න ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 04 ක ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කරගත යුතු ය. |